# ජාතික ඖෂධ නියාමන අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් 2021.03.09 දින කැඳවන ලද අයදුම්පත් වලට අමතරව නැවත අයදුම්පත් කැඳවනු ලැබේ. (එදින පළ කරන ලද පුවත්පත් දැන්වීමට අනුව ලද අයදුම්පත් අවලංගු නොවේ)

මෙම තනතුර 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතෙහි අංක 15 දරන වගන්තිය හා ඒවායේ උප වගන්ති ප්‍රකාරව වසර 3 ක උපරිම සේවා කාලයකට යටත්ව, සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට දායකත්වය දරන තනතුරක් වේ.

**අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රධාන විධායක නිලධාරී) තනතුර : (පුරප්පාඩු ගණන 01 යි)**

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

වෛද්‍යවේද්‍ය, ඖෂධ වෛද්‍යවේද්‍ය, ඖෂධවේද්‍ය හෝ ඊට අදාළ වෙනත් විෂයයක් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් සහිතව ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ අවම වශයෙන් අවුරුදු පහක (05) කළමනාකරණ පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

වෛද්‍යවේද්‍ය, ඖෂධ වෛද්‍යවේද්‍ය, ඖෂධවේද්‍ය හෝ ඊට අදාළ වෙනත් විෂයයක් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක්

සමග

ආයතනයෙහි ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහක (05) අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** : අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**තනතුරට අදාළ වැටුප් පියවර :** කළමනාකරණ චක්‍රලේඛ 02/2016 පරිදි HM 2-1 2016 රු. (91,645-12x2,700-124,045/-) වැටුප් පරිමාණයේ 2020.01.01 දිනට හිමි වැටුප් පියවර වන රු. 91,645/- හා අනුමත දීමනා

**බඳවා ගැනීමේ ක්‍රමය** : පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගැනීමෙන් අනතුරුව අධිකාරිය විසින් අමාත්‍යවරයා විමසා පත්කරනු ලැබේ.

**වෙනත් කරුණු** :

**සෑම ඉල්ලුම්කරුවෙක්ම,**

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතුය.

නිවැරදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකපත්‍ර වල පිටපත් සමග 2021.05.05 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ සභාපති, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, අංක 120, නොරිස් කැනල් පාර, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු අතර, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති,**
**ජාතික ඖෂධ නියාමන අධිකාරිය.**